(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 86]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0058/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළ අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් කරන ලද විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද; සහ

(iii) ප්‍රවේශ පත්‍ර සඳහා වියදම් සහ හෝටල් ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඉහත සඳහන් එක් එක් සංචාරයේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරවලදී කැටුව යන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් සඳහා දැරීමට සිදු වූ වියදම් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් විදේශ සංචාරය සඳහා හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ සඳහා අයවැයෙන් වෙන් කරන ලද දීමනාව කොපමණද; සහ

(ii) එවැනි සංචාර සඳහා සපයනු ලැබූ පරිපූරක වැය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1140/'08

2.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ඊඩී/1/12/10/30/1 හා 2008.04.24 දිනැති ලිපියෙන් "ක්‍රියාන්විත සේවය" ගණය යටතේ අනුක්‍රමික අංකය 5 S 508 වන ආදිත්‍යා විනූරි ඉහාරා විජේරත්න නමැති ශිෂ්‍යාව කොළඹ 7, සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලයට ඇතුලත් කර ගන්නා ලෙස විදුහල්පතිනියට දැනුම් දී තිබේද;

(ii) මේ සම්බන්ධව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හෙට්ටිආරච්චි මහතා විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2008.02.29 දිනැතිව ලිපියක් යොමුකර තිබේද;

(iii) උක්ත කරුණට අදාළව, ඔබතුමා ද සටහනක් යොදා මෙම දරුවා සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් කරගන්නා ලෙස දරුවාගේ පියා වන අයි. ඒ. විජේරත්න මහතා විසින් කරන ලද ඉල්ලීම අදාළ විදුහල්පතිනිය වෙත යොමුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රණවිරුවන්ට ලබාදෙන ප්‍රමුඛතාවය යටතේ හෝ කවර පදනමක් යටතේ හෝ ඉහත දරුවාට තවමත් පාසලක් ලැබී නොමැති බව එතුමා දන්නේද?

(ඇ) මෙම දරුවා ඉහත සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් කරගැනීමට ඇති නොහැකියාව එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) ඇයට පාසලක ඉගෙනීමට ඇති අයිතිය එතුමා පිළිගන්නේද?

(ඉ) එසේ නම්, ඇයට පාසලක් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නේද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1159/'08

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) උතුරුමැද පළාත් සභාවේ කටයුතු සඳහා ඉදිකෙරෙමින් පවතින අමාත්‍යාංශ ගොඩනැගිලි සංකීර්ණයේ අදාළ ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) ඉදිකිරීම් කටයුතු භාරදුන් ආයතනය කවරේද;

(iii) අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) ඇස්තමේන්තුගත මුදලින් කොපමණ මුදලක් ගෙවන ලද්දේද;

(v) එසේ ගෙවන ලද දිනය සහ ගෙවීමට ඉතිරි මුදල කොපමණද;

(vi) මුල් සැලැස්මට අනුව මෙම ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව කොපමණද;

(vii) එහි සම්පූර්ණ වර්ග ප්‍රමාණය කොපමණද;

(viii) එම මුල් සැලැස්මට පරිබාහිරව නව මහලක් එකතු කරන ලද්දේද;

(ix) එසේ නම්, එම මහලේ වර්ග ප්‍රමාණය කොපමණද;

(x) එම මහල එකතු කිරීම සඳහා වෙන්කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ලේ වැඩ ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිතව තිබූ දිනයන් කවරේද;

(ii) දැනට පවත්නා තත්වය අනුව එම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නියමිතව ඇති දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1160/'08

4.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පානීය ජලය සපයන මහවැලි සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයට අයත් සූරියවැව වැව් රක්ෂිතයේ සිටින අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම අනවසර පදිංචිකරුවන්ගෙන්, ජලාශයට එක්වන අපද්‍රව්‍ය නිසා පානීය ජලය ලබා ගන්නා ජලාශය අපිරිසිදු වන බව එතුමා පිළිගන්නේද?

(ඇ) (i) වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන්ගේ නම, ලිපිනය, පවුලේ සාමාජික සංඛ්‍යාව සහ මේ දක්වා ඔවුන් අනවසරයෙන් පදිංචිවී සිටි කාලය, එක් එක් පවුලට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වීරවිල ගුවන් තොටුපල තැනීමේදී ඉඩම් අහිමිවන අයට දීමට නියමිතව තිබූ මහවැලි අධිකාරියේ ඉඩම් කට්ටි, අදාළ ගුවන් තොටුපල එම ස්ථානයේ ඉදිකරනු නොලබන බැවින් වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන්ට එකී ඉඩම් ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඔවුන්ට වාරි ඉඩම් සහ පදිංචියට ගොඩ ඉඩම් ලබා දෙන ස්ථානය සහ අදාළ වාරි සහ ගොඩ ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) දීර්ඝ කාලයක් අනවසර පදිංචිකරුවන් විසින් උපයාගත් දේපල ඔවුන් ඉවත් කිරීමේදී අහිමිවන නිසා, වාණිජ වටිනාකම පදනම් කරගෙන වන්දි ගෙවීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/'08

5\. ගරු වජිර අබේවර්ධන මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙවර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පූර්ණකාලීන පාඨමාලා හැදෑරීම සඳහා අයදුම්කර සිටි අවුරුදු 24ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් කොපමණ සංඛ්‍යාවකට පූර්ණකාලීන පාඨමාලා ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් අයෙකුගෙන් රු. 250/- බැගින් ගෙන එහෙත් වයස අනුව පාඨමාලා සඳහා තෝරා නොගත්, එහෙත් අවුරුදු 24 ට වඩා වැඩි අයදුම්කරුවන්ගෙන් අදාළ ආයතනය උපයාගත් මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/'09

6\. ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, නාගොඩ, පරණතානායම්ගොඩ කණිටු විද්‍යාලය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) මෙම පාසලට අයත් භූමිය පරිත්‍යාග කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) මෙම පාසල වසා දමා කොපමණ කාලයක් ගතවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු ආණ්ඩුකාරවරයෙකු වන එම්. එස්. අමරසිරි මහතා ඇතුළු විශාල උගතුන් පිරිසක් රටට දායාද කිරීමට මෙම පාසල මූලික වූ බවත්;

(ii) මෙම පාසල වසාදැමීම නිසා අඩු ආදායම්ලාභී දෙමව්පියන්ට අධික මුදලක් ගෙවා පාසල් වෑන් රථවලින් ආසන්න පාසල්වලට තම දරුවන් යැවීමට සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ගොඩනැගිලි ඇතුළු පහසුකම් සහිත මෙම පාසලට තම දරුවන් එවීමට දෙමව්පියන් සූදානම් බැවින්, අවශ්‍ය ගුරුවරුන් ලබාදී කොපමණ කාලයක් තුළ මෙම පාසල විවෘත කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1238/'09

7.

ගරු ජේමසිරි මානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය - නිලාවැලි හරහා මාර්ගයක් ඉදිකෙරෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ දිග හා පළල කොපමණද;

(ii) එකී මාර්ගයට අදාළව ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඊට අදාළව මූල්‍ය පහසුකම් ලැබෙන්නේ කෙසේද;

(iv) එම මාර්ගය නම්කර තිබෙන්නේ කවර නමකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0084/'08

8.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මිහින් එයාර් සමාගම සංස්ථාගත කළ දිනය කවරේද;

(ii) එම සමාගමේ ප්‍රථම වාණිජ ගුවන් ගමන සිදු කළ දිනය කවරේද;

(iii) මිහින් එයාර් සමාගම ආරම්භයේ සිට අද දක්වා සිටි එම සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් පුද්ගලයාට එක් එක් වසර තුළ දී ගෙවන ලද වැටුප්, මිහින් එයාර් ගුවන් සේවයෙහි භාවිතා කළ ප්‍රවේශපත්‍ර, අනෙකුත් ගුවන් සේවා වෙත ප්‍රවේශපත්‍ර සඳහා කරන ලද ගෙවීම් සහ ලබා දුන් අනිකුත් වරප්‍රසාද කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලබා දී ඇති හා ලබා දීමට නියමිත වෙනත් ප්‍රතිලාභ කවරේද;

(ii) මෙම සමාගම ක්‍රියාත්මක වූ දින සිට මාසිකව එය ලැබූ සමස්ත ශුද්ධ ලාභය හා දළ ලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1170/'09

9.

ගරු විජිත රණවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006, 2007 සහ 2008 වර්ෂ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වාර්ෂිකව නිකුත් කර තිබෙන නව ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂය අවසන් වනවිට දිස්ත්‍රික්කයට නිකුත් කර ඇති සම්පූර්ණ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වයස අවුරුදු 16 සම්පූර්ණ වුවද, දිස්ත්‍රික්කය තුළ මේ දක්වා ජාතික හැඳුනුම්පත් ලබාගෙන නොමැති අය සිටින්නේද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට නොහැකි වී ඇති බාධාවන් කවරේද;

(iv) එම බාධාවන් මඟ හරවා, හැඳුනුම්පත් නොමැති අයට හැඳුනුම්පත් ලබා දීමට අදාළ අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) පරිගණකගත ජාතික හැඳුනුම්පත (e-NIC) ලබාදීම ආරම්භ කරන්නේ කවදාද;

(ii) එම හැඳුනුම්පතක් (e-NIC) ලබා ගැනීම සඳහා පුරවැසියෙකු විසින් දැරිය යුතු වියදම කොපමණද;

(iii) දෙපාර්තමේන්තුවේ කටයුතු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා විමධ්‍යගත කිරීමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/'09

10.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මොටර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතුරින් ඩීසල් වාහන සහ පෙට්‍රල් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලියාපදිංචි මුළු පෙට්‍රල් වාහන අතුරින් යතුරුපැදි, ත්‍රීරෝද රථ සහ වෙනත් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සම්පූර්ණ පෙට්‍රල් අලෙවියෙන් , යතුරු පැදි සහ ත්‍රීරෝද රථ සඳහා කවර ප්‍රතිශතයක් අලෙවි වන්නේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) පෙට්‍රල් මිල අඛණ්ඩව ඩීසල් මිලට වඩා වැඩි අගයක් ගැනීම හේතුවෙන් ත්‍රීරෝද රථ සහ යතුරුපැදිවල ගමන් ගන්නා මගීන් දැඩි අපහසුතාවයකට පත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1239/'09

11.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ධීවර සංස්ථාව 2000 වර්ෂයේ සිට මේ දක්වා ලබා තිබෙන ලාභය හෝ පාඩුව කොපමණද;

(ii) පාඩුවක් ලබා තිබේනම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාඩුව ලාභයක් බවට පත් කිරීම සඳහා මේ වන විට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0874/'08

12.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1171/'09

13.

ගරු විජිත රණවීර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රුපියල් 1,230,000/= ක වෙළඳපොළ වටිනාකමක් සහිත, 2000 වර්ෂයේ නිෂ්පාදිත අංක 227–5808 දරන ජල බවුසරය, හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අයත් එකක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සුනාමි ව්‍යසනයට හසුවී අබලන්ව තිබූ එම ජල බවුසරය අලුත්වැඩියා කිරීම සඳහා වියදම් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(ii) මෙම බවුසරය අලුත්වැඩියා කිරීමේදී අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ආර්ථික වාසිය, වාහනයේ සේවා කාලය සහ තත්වය සැලකිල්ලට ගෙන කටයුතු කර තිබේද;

(iii) මහජන මුදල් අරපිරිමැසුම්දායක ලෙස හා කාර්යක්ෂමව යෙදවීමට අදාළ සභාපතිවරයා කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත කරුණු පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර තිබේනම් අදාළ පරීක්ෂණ වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත කරුණට අදාළව පවත්නා නීතියට පටහැනිව කටයුතු කර ඇති පුද්ගලයින්ගේ නම් සහ තනතුරු කවරේද;

(ii) චෝදනා ලැබූ පුද්ගලයන් සම්බන්ධයෙන් ගනු ලැබූ විනයානුකූල ක්‍රියාමාර්ග කවරේද;

(iii) අයථා ලෙස පරිහරණය කරනු ලැබූ මුදල් නැවත අදාළ ප්‍රාදේශීය සභාවට අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1203/'09

14.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රණවිරුවන් සඳහා නිවාස 50,000ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම රණවිරු නිවාස ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ කවදාද;

(ii) මෙම නිවාස ඉදිකිරීම ආරම්භකර ඇත්නම් කවර ස්ථානයක කොපමණ සංඛ්‍යාවක වැඩ ආරම්භකර තිබේද;

(iii) වැඩ අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) රණවිරුවන් වෙත ලබාදී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) වැයකර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) රණවිරුවන් සඳහා නිවාස ඉදිකරන ව්‍යාපෘතිය ඉතාමත් මන්දගාමීව සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1257/'09

15.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂය තුළ ධීවර වරායන් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමක් සිදුකර තිබේද;

(ii) එසේනම් එම ස්ථාන සහ අදාළ දිනයන් කවරේද;

(iii) මුල්ගල් තැබීම සිදුකළ ස්ථානවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේද;

(iv) එසේනම් ඒ කවර ස්ථාන වලද;

(v) අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේ කවදාද;

(vi) මේ වන විට එම ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2009 මැයි මස 19 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

3.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 1),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අන්නමලෛ නඩේසු සිවශක්ති මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 නොවැම්බර් මස 04 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

4.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 2),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2009 ජනවාරි මස 09 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

5.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 3),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 දෙසැම්බර් මස 05 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

6.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 4),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සී. චන්ද්‍රනේරු මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 සැප්තැම්බර් මස 26 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

7.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 5),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 ජූලි මස 08 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

8.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරප්‍රසාද (අංක 6),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2008 ජූනි මස 20 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා හූ දර්ශන නිර්මාණ ශිල්පී ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පස සංරක්ෂණ පනත යටතේ නියෝග,—(450 වැනි අධිකාරය වූ) පස සංරක්ෂණ පනතේ 4 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, පස සංරක්ෂණ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වන 2009.04.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පස සංරක්ෂණ පනත යටතේ නියමය,—(450 වැනි අධිකාරය) පස සංරක්ෂණ පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2008 මැයි මස 22 දිනැති අංක 1550/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*4.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— ශාක ආරක්ෂක පනත යටතේ නියෝග,— 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 12 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඉ) සහ (එ) ඡේද යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 පෙබරවාරි මස 10 දිනැති අංක 1588/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත —දෙවැනි වර කියවීම.

*7.

වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*10.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*12.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*14.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04)[1]

*18.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*19.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007. 08. 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*23.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකහත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*24.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

25.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

26.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

27.

ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

ශ්‍රී ලංකා ව්‍යූහාත්මක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0875/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා ගාල්ල දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ ගාල්ල දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0876/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා මාතර දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ මාතර දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0877/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0878/'08

4.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ පොලොන්නරුව දිස්ත්‍රික්කය සඳහා මුළු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0879/'08

5.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා මුළු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'08

6.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කළුතර දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කළුතර දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කළුතර දිස්ත්‍රික්කය සඳහා මුළු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0881/'08

7.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා ගම්පහ දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ ගම්පහ දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0882/'08

8.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කොළඹ දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කොළඹ දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?